# ඔබට සුදුසු කර්මාන්තයක්: බිම් මල්

**සුළු මුදලක් ආයෝජනය කිරීම තුළින් ආරම්භ කළ හැකි, ව්‍යාපාරයක් වශයෙන් සාර්ථකව පවත්වා ගෙන යා හැකි, කර්මාන්ත වල ආයෝජන, වියදම් හා ආදායම් විස්තර කෙරෙන ලිපි පෙලක් මේ කලාපයෙන් ආරම්භ වේ. අද විස්තර කෙරෙන්නේ 'බිම්මල්' පිළිබඳවයි. මෙම වගාව ආරම්භ කිරීම, පවත්වා ගෙන යාම හා ආධාර සපයන ආයතන පිළිබඳ විස්තරයක් "ගොවි ජනතාව" සඟරාවේ 1988 වසරේ මාර්තු මස නිකුත්වූ (වෙළුම අංක 5 අංක 1 හා 2) කලාපයට ඇතුළත් විය.**

බිම මල් ගෙවන හතු සිංහල අපගේ ආහාර වල වැදගත් කොටසකි. කටකින් බිම්මල් කඩා රසවත් ආහාරයක් එදා පටන් මේ දක්වා අපේ සිංහල ගෙවල භාවිතා කරන ලදී. මෙරටේ පමණක් නොව මෙය එතරද ජනප්‍රිය ආහාරයකි. චීනය, කොරියාව, ඈත පෙරදිග අරාබිකරය, යුරෝපයේ ද බිම්මල් පරිභෝජනය ජනප්‍රියය. ලංකාවේ දේශීය වෙළඳ පොලේ අමු හා වියලි බිම්මල් දැන් දැන් ජනප්‍රිය වේ. වගාව ව්‍යාප්ත කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, හා පෞද්ගලික ආයතන වගා කරුවන්ට උපදෙස් හා ආධාර දෙයි.

ස්වයංරැකියා සඳහා තරුණ සේවා සභාව හා බැංකු, ව්‍යවසායකයන්ට උපකාර කෙරේ. වැටිපියොන් හෙවත් බොත්තම් හතු සඳහා සඳහා ජගත් වෙළඳපොලේ

| ද්‍රව්‍ය | ප්‍රමාණය | වැය රු. |
|---|---|---|
| 01. ලි කුඩු | කිලෝ ග්‍රෑම් 100 | 20.00 |
| 2. දහයියා | කිලෝ ග්‍රෑම් 08—10 | 5.00 |
| 3. සෝයා ඇට අපද්‍රව්‍යය | කිලෝග්‍රෑම් 03 | 30.00 |
| 04. හුණු | කිලෝග්‍රෑම් 01 | 1.00 |
| 05. ජිප්සම් | කිලෝග්‍රෑම් 01 | 12.00 |
| 06. කුකුල් අපද්‍රව්‍ය | ග්‍රෑම් 150—200 | 2.50 |
| 07. කපු | ග්‍රෑම් 5—10 | 5.00 |
| 08. එප්සම් ලුණු | ග්‍රෑම් 01 | 9.50 |
| 09. පොලිතීන් | — | 80.00 |
| 10. පි වී. සි නල | - - | 70.00 |
| 11. රබර් පටි | 01 පැකට | 2.50 |
| 12. විෂනාශක | - - | 30.00 |
| 13. විජ් | - - | 50.00 |
| | | 317.50 |

හතු පැකට 225.
පැකට් 1 කින් නිපදවා හතු ගත හැකි ප්‍රමාණය කිලෝ ග්‍රෑම 1.5 කි.
එබැවින්:

සම්පූර්ණ නිෂ්පාදනය - - 225 (පැකට්) X 1.5 (කි.ග්‍රෑ)
- - 337.5 කිලෝ ග්‍රෑම
සම්පූර්ණ වියදම - - රු:317.50 කි. ÷337.5
කිලෝවක වැය = ශත 00.73 කි.

මිලයෙන් වැඩිවෙයි. මෙය ලෝක වෙළඳ පොළේ වැදගත් ද්‍රව්‍යයක් ද වෙයි. මෙ වර්ගයේ හතුවල ජාත්‍යන්තර නිෂ්පාදනය 1986දී ටොන් දශ ලක්ෂයක් පමණ විය. මෙ වර්ගයේ හතු බටහිර ජර්මනියේ පමණක් එක පුද්ගල වාර්ෂික භාරිභෝජනය කිලෝ 3.2 කි. යුරෝපයේ ද මෙ වර්ගයේ හතු ප්‍රචලිත ය. ඇමෙරිකානු වෙළඳ පොලේ ඒක පුද්ගල වාර්ෂික පරිභෝජනය කිලෝ 1.2 ක් වේ. එට වෙළඳ පොලේ යුරෝපීය වෙළඳ පොළට වඩා ඉල්ලුම විශාලයි. ශීත කළ ඇසුරුම්වල හතු අපනයන මුහුදු මාර්ගයෙන් කිරීම නිසා වෙළඳ පොලේ විශාල වෙනසක් සිදුවිය හැක. මේ හැර මෙරට ව්‍යාප්ත හතු වර්ගයකි, විශාල හා පළල් සුදු හතු. දැනට ග්‍රෑම් 200ක් රුපියල් 7.50 කි. සුපරි වෙළෙඳහල් වල. ඖෂධ ශාලාවල දැනට විකිණෙන බිම්මල් වලින් හොඳ අදායමක් ලබා ගත හැක. ☐

ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ
කෘෂිකර්ම සැළසුම් අධ්‍යක්ෂ

**ආරිය අබේසිංහ**
**විසිනි**